# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 2428/02 - 2025 මාර්තු මස 17 වැනි සඳුදා - 2025.03.17

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 76අ වගන්තිය අනුව පළාත් පාලන ආයතන ඡන්ද විමසීම තරග කරනු ලබන සියලුම දේශපාලන පක්ෂවල ලේකම්වරුන්/ බලයලත් නියෝජිතයින් සහ ස්වාධීන කණ්ඩායම් නායකයින් වෙත නිකුත් කරනු ලබන මැතිවරණ ප්‍රචාරණ කටයුතුවල දී අනුගමනය කළ යුතු ප්‍රචාරක සීමා**

පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ 76අ වගන්තිය අනුව 2025.05.06 වැනි දින පවත්වනු ලබන පළාත් පාලන ආයතන ඡන්ද විමසීමේ දී දේශපාලන පක්ෂ/ ස්වාධීන කණ්ඩායම් සහ අපේක්ෂකයන් ප්‍රචාරණ කටයුතුවල දී අනුගමනය කළ යුතු, මැතිවරණ කොමිෂන් සභාව විසින් පනවනු ලබන ප්‍රචාරක සීමා පිළිබඳ නියමයන් උපලේඛන 01 හි සඳහන් වේ.

**ආර්.එම්.ඒ.එල්. රත්නායක,**
සභාපති,
මැතිවරණ කොමිෂන් සභාව.

**එම්.ඒ.පී.සී. පෙරේරා,**
සාමාජික,
මැතිවරණ කොමිෂන් සභාව.

**අමීර් ෆායිස්,**
සාමාජික,
මැතිවරණ කොමිෂන් සභාව.

**ඒ. ෂන්මුගනාදන්,**
සාමාජික,
මැතිවරණ කොමිෂන් සභාව.

**මහාචාර්ය ලක්ෂ්මන් දිසානායක,**
සාමාජික,
මැතිවරණ කොමිෂන් සභාව.

2025 මාර්තු මස 11 වැනි දින,
සරණ මාවත,
රාජගිරිය.
මැතිවරණ කොමිෂන් සභාවේ දී ය.

**උපලේඛන 01**

2025.05.06 දින පැවැත්වීමට නියමිත පළාත් පාලන ආයතන ඡන්ද විමසීම සඳහා ප්‍රචාරක කටයුතු සීමා කිරීම පිළිබඳ පහත නියමයන් මැතිවරණ කොමිෂන් සභාව විසින් පනවනු ලැබේ.

ප්‍රචාරණ විධි හා රැස්වීම් :

1. ප්‍රසිද්ධ ස්ථානවල අපේක්ෂක ප්‍රවර්ධනය සඳහා වූ දැන්වීම්, ප්‍රචාරක පුවරු, පෝස්ටර්, කටවුට්, ධජ, පතාක, බැනර්, තොරණ්, චිත්‍ර, ඡායාරූප, ඡන්ද ලකුණු/අපේක්ෂක නම්, ආවේනික වැකි ප්‍රදර්ශනය හා අපේක්ෂකයන්/ පක්ෂ ප්‍රවර්ධනය වන ඇඳළුම් සහ හිස් වැසුම් තහනම් කර තිබේ.

2. කිසිදු අවස්ථාවක දේශපාලන පක්ෂ/ කණ්ඩායම් සහ අපේක්ෂකයන් ප්‍රවර්ධනය සඳහා ජාතික ධජ, ආගමික ධජ, ආගමික සංකේත ප්‍රදර්ශනය නොකළ යුතු ය.

3. මහජනතාවට පීඩාකාරී නොවන ලෙස උපරිම පස් දෙනෙකුගෙන් (05) පමණ සමන්විත පිරිසක් සමඟ ගෙයින් ගෙට ගොස් පමණක් අත් පත්‍රිකා බෙදිය හැකි නමුත් එම පත්‍රිකා ප්‍රදර්ශනය කළ නොහැක. සෑමවිටම එම අත් පත්‍රිකා මුද්‍රණය කරන ලද මුද්‍රණාලයේ ලිපිනය, ප්‍රකාශකගේ තොරතුරු යන විස්තර එම පත්‍රිකාවේ මුද්‍රණය කර තිබීම අනිවාර්යය වේ.

4. ඡන්ද විමසීම සඳහා තරග කරනු ලබන පක්ෂයකට/ කණ්ඩායමකට අපේක්ෂකයෙකුට ආධාර වශයෙන් පවත්වන රැස්වීමක දී, එම රැස්වීම පැවැත්වීමට දින හතකට (07) පෙර සිට රැස්වීම පැවැත්වෙන ස්ථානය, දිනය, වේලාව, කථික ලැයිස්තුව හා අපේක්ෂකයන්ගේ නම් ආදී විස්තර පමණක් ඇතුළත් පෝස්ටරයක් අදාළ පළාත් පාලන බල සීමාවේ පමණක් ප්‍රදර්ශනයට අවසර ඇත.

5. රැස්වීම පැවැත්වෙන දිනයේ දී එම රැස්වීම පැවැත්වෙන ස්ථානයේ පමණක් නීත්‍යානුකූලව පිළියෙළ කරනු ලැබූ අත් පත්‍රිකා, දැන්වීම්, චිත්‍ර හා ඡායාරූප ආදිය ප්‍රදර්ශනය කළ හැකි අතර රැස්වීමක් පැවැත්වීමේ දී රැස්වීම් භූමිය තුළ පමණක් සැරසිලි කිරීමට ඉඩ ලබා දිය හැක. එසේම එළිමහන් ස්ථානයක් නම් වේදිකාව අවට පමණක් සැරසිලි කිරීමට ඉඩ ලබා දෙන අතර, රැස්වීමක් පැවැත්වෙන අවස්ථාවේ දී එම ප්‍රදේශයේ මහා මාර්ග, වට රවුම් හා මංසන්ධිවල කොඩි, බැනර්, ප්‍රචාරක පුවරු ප්‍රදර්ශනය නොකළ යුතු ය. එසේම ශබ්ද විකාශන යන්ත්‍ර රැස්වීම් භූමියේ ඇතුළත පමණක් සවිකල යුතු අතර, එහි ශබ්දය රැස්වීම් භූමියෙන් පිටතට උස්තාරණය නොවන ලෙස රැස්වීම් භූමියට පමණක් සීමා කිරීම කළ යුතු ය.

6. දිස්ත්‍රික් මැතිවරණ කාර්යාලයෙන් අනුමැතිය ලබා ගන්නා ලද අපේක්ෂකයාගේ වාහනයේ පමණක් අපේක්ෂක ප්‍රචාරක පෝස්ටර් කොඩි හෝ පතාක ප්‍රදර්ශනය කිරීමට අවසර ලබාදෙන අතර, අපේක්ෂකයෙකු ගමන් නොකරන වාහනයක ඡන්ද විමසීම සම්බන්ධ අත් පත්‍රිකා, ප්‍රදර්ශන පත්‍ර, දැන්වීම් කොළ, චිත්‍ර, අපේක්ෂකයින්ගේ ඡායාරූප, ලකුණු ප්‍රදර්ශනය කළ නොහැක. අපේක්ෂකයකු ගෙන යාමට ඉඩ ඇතැයි සලකා විශාල වාහන සංඛ්‍යාවක මෙසේ කොඩි හෝ පතාක ප්‍රදර්ශනය කළ නොහැක. මහජනයාගේ ගමනාගමනය සඳහා යොදා ඇති දුම්රිය, ලංකා ගමනාගමන මණ්ඩලයේ බස් රථ හෝ පෞද්ගලික බස් රථවල හෝ වෙනත් පෞද්ගලික වාහනවල හෝ මෙවැනි දෑ ප්‍රදර්ශනය කළ නොහැක.

7. ප්‍රචාරක කටයුතුවල දී රිය පෙරහැරවල් පැවැත්වීම සිදුකළ නොහැක. පවත්නා නීති ප්‍රතිපාදන තුළ රථ වාහන සංඛ්‍යාව නිශ්චිතවම සඳහන් කර නොමැති නමුත් රිය පෙරහැරක් යනු සාමාන්‍ය මහජනතාවට අවහිර වන සේ පක්ෂ/ අපේක්ෂක/ දේශපාලන ප්‍රවර්ධනයක් ඇති කරමින් රථ වාහන පහකට හෝ ඊට වැඩි සංඛ්‍යාවක් එකක් පසුපස එකක් ගමන් කිරීම ලෙස සලකනු ලැබේ.

**නිවේදිත ප්‍රචාරණ කාර්යාලවල ප්‍රචාරණ කටයුතු :**

1. නිවේදිත මැතිවරණ කාර්යාල පරිශ්‍රයක ඇතුළත සීමාව තුළ පමණක් පක්ෂයේ නම හා ලකුණ/ ස්වාධීන කණ්ඩායමේ අංකය හා ලකුණ, අවශ්‍ය නම් සියලු අපේක්ෂකයන්ගේ රුව සහිත එක් ප්‍රචාරක පුවරුවක් ප්‍රදර්ශනය කිරීමට ඉඩ ලබාදෙන අතර මෙම පුවරුව වර්ග අඩි 60 නොඉක්මවිය යුතු ය. මධ්‍ය නිවේදිත කාර්යාලයේ පමණක් පක්ෂයේ/ කණ්ඩායමේ නායකයාගේ ඡායාරූපය මෙම ප්‍රදර්ශන පුවරුවට ඇතුළත් කළ හැකි ය. තව ද කාර්යාල ඇතුළත භූමියේ කොඩි 06 ක් ප්‍රර්ශනය කිරීමට

අවස්ථාව ඇත. එයට අමතරව වෙනත් කිසිදු සැරසිල්ලක් සිදු කිරීමට ඉඩ ලබානොදෙන අතර කිසිදු විටක මහා මාර්ගය හරහා මහා මාර්ගය මත, පදික වේදිකාවේ, විදුලි රැහැන් කණුවල පදික වේදිකා, මායිම් තාප්ප ආදියෙහි කිසිදු ආකාරයක දැන්වීම්, කටවුට්, ධජ, පතාක ප්‍රදර්ශනය කළ නොහැකිය. පෙර සඳහන් එකඟතාව මත ලබා දී ඇති අවසරය අයුතු ලෙස භාවිතා කිරීමේ ප්‍රයත්නවල දී වලංගු නීතිය අනුව එසේ කිසිදු ස්ථානයක දැන්වීම්, ප්‍රචාරක පුවරු, ප්‍රදර්ශනය කළ නොහැකිය යන නියමය ක්‍රියාත්මක කරනු ලැබේ.

2. අදාළ පක්ෂයේ/ කණ්ඩායමේ අපේක්ෂකයකු නොවන වෙනත් කිසිදු දේශපාලනඥයකුගේ හෝ අපේක්ෂකයකුගේ ඡායාරූප, ඡන්ද ලකුණු, ආවේනික වැකි යනා දී කිසිවක් කාර්යාලයක ප්‍රදර්ශනය කළ නොහැකි ය.

3. කිසිදු නිවේදිත ප්‍රචාරක කාර්යාලයක ජාතික ධජ, ආගමික ධජ, ආගමික සංකේත ප්‍රදර්ශනය නොකළ යුතු ය.

4. එමෙන්ම, සෑම නිවේදිත ප්‍රචාරක කාර්යාලයක ම ප්‍රදර්ශනය කරන පක්ෂ/අපේක්ෂක ප්‍රවර්ධනය සඳහා වූ පුවරු, ධජ, පතාක, ඡායාරූප යනාදිය ඡන්ද විමසීම් දිනට පැය 48 කට පෙර ඉවත් කළ යුතු වේ. එසේ වුවත් නිවේදිත මධ්‍ය කාර්යාලය හා නිවේදිත කොට්ඨාස කාර්යාලවල එම කාර්යාලය හැඳින්වීම සඳහා වූ නාම පුවරුව පමණක් ප්‍රදර්ශනය කළ හැක. යම් හෙයකින් එම කාර්යාල ඡන්ද මධ්‍යස්ථානයක සිට මීටර 500 ක දුරක් ඇතුළත පිහිටා ඇත්නම් මෙම කාර්යාලය ඉවත් කළ යුතු ය.

5. අපේක්ෂකයකු පදිංචි නිවසක් නිවේදිත ප්‍රචාරක කාර්යාලයක් ලෙස පවත්වාගෙන යාමේ දී එම නිවේදිත කාර්යාලය ද මෙහි සඳහන් සීමාවන්ට යටත්ව සැරසිළි සිදුකළ හැක.

6. එසේම නිවේදිත ප්‍රචාරක කාර්යාල ලෙස භාවිතා කිරීමට අනුමැතිය ලබා ගන්නා ලද තාවකාලික මඩු සඳහා එසේ නිවේදිත ප්‍රචාරක කාර්යාලයක් ලෙස පවත්වාගෙන යෑමට අනුමැතිය ලබාගත් දේශපාලන පක්ෂය/ කණ්ඩායම හෝ නියෝජිතයා විසින් පැය 24 පුරාවට ම එම තාවකාලික මඩු සඳහා ආරක්ෂාව ලබා දිය හැකි වැඩ සැලැස්මක් සකස් කිරිම අත්‍යාවශ්‍ය වේ.

7. කිසිදු නිවේදිත මැතිවරණ කාර්යාලයක දී දිවයිනේ පොදු නීති හා මැතිවරණ නීති උල්ලංඝනය කිරීම් සිදු නොවිය යුතු ය.

අංක 2034/37 දරන 2017.09.01 දිනැති *ගැසට් පත්‍රයට* අනුව දේශපාලන, සමාජයීය, ආගමික, ජාතික, සංස්කෘතික හෝ වෙනත් යම් උත්සව හෝ අවස්ථා සඳහා සියලුම ආකාරයේ පොලිතින් වර්ග සැරසිලිවලට භාවිතා කිරීම තහනම් කර ඇත. ඒ අනුව, ඉහත සඳහන් පරිදි නීත්‍යානුකූලව පිළියෙල කරනු ලබන අත් පත්‍රිකා, දැන්වීම්, චිත්‍ර හා ඡායාරූප, ධජ, පතාක, ප්‍රචාරක පුවරු හා ආරුක්කු ආදිය ද පොලිතින් භාවිතයෙන් තොරව සකස් කළ යුතු ය. ප්‍රචාරක රැස්වීම් පැවැත්වෙන ස්ථානවල සහ නිවේදිත ප්‍රචාරක කාර්යාලවල සැරසිලි ද සියලුම ආකාරයේ නීත්‍යානුකූල ප්‍රචාරණ කටයුතුවල දී ද පොලිතින් භාවිතා කිරීමෙන් වැලකිය යුතු ය.

EOG - 03 - 0186

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.